සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I පත්‍රය

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉරබටු තරුව, පහන්තරුව නමින් හඳුන්වන්නේ මින් කුමන ග්‍රහලෝකය ද?

(1) බුධ (2) සිකුරු (3) අඟහරු (4) බ්‍රහස්පති

(02) - සෞරග්‍රහ මණ්ඩලයේ දෙවන විශාලත ම ග්‍රහලෝකය වේ.

- දර්ශනීය වළලු පද්ධතියකින් යුක්ත ය.

ඉහත සඳහන් සුවිශේෂී ලක්ෂණ සහිත ග්‍රහලෝකය වන්නේ,

(1) බ්‍රහස්පති (2) සෙනසුරු (3) යුරේනස් (4) නෙප්චූන්

(03) "කැල්ටෙක්" තාරකා විද්‍යා ආයතනය පිහිටා ඇත්තේ,

(1) ඇමරිකා එක්සත් ජනපදයේ ය. (2) රුසියාවේ ය.
(3) චීනයේ ය. (4) එංගලන්තයේ ය.

(04) සමකයට හිරු මුදුන්වන දින දෙක නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(1) ජනවාරි 22 දෙසැම්බර් 23 (2) අගෝස්තු 21 සැප්තැම්බර් 23
(3) මාර්තු 21 සැප්තැම්බර් 23 (4) අප්‍රේල් 23 ඔක්තෝබර් 21

(05) ශ්‍රී ලංකාවේ 1 : 50 000 භූ ලක්ෂණ සිතියම් අනුව බෙදා ඇති කොටස් ගණන කීය ද?

(1) 24 කි. (2) 32 කි. (3) 54 කි. (4) 92 කි.

❖ අංක 06 - 10 දක්වා වගන්තිවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(06) පෘථිවිය තම අක්ෂය වටා කැරකැවෙමින් සූර්යයා වටා ගමන් කිරීම ................................. නමින් හඳුන්වයි.

(07) පෘථිවි වායුගෝලයේ වායු සංයුතිය අනුව වැඩියෙන් ම පවතින්නේ ............................ වායුවයි.

(08) සින්දු ගංගාව පිහිටා ඇති රට .................................. යි.

(09) ඉහළ වායුගෝලයේ ඇති ..................................... වායු ස්තරය මගින් සූර්ය විකිරණයේ පාරජම්බුල කිරණ පෘථිවියට ඒම පාලනය කරයි.

(10) ලෝකයේ දෙවැනි විශාලතම සිනමා කර්මාන්තය පිහිටා ඇත්තේ ඉන්දියාවේ ................................ නගරයේ ය.

- **අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(11) ආලෝකය හා ශක්තිය නිකුත් කරන නිසා සූර්යයා තාරකාවකි. ( )

(12) උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය සම්බන්ධ කරමින් නිර්මාණය කර ඇති කල්පිත රේඛා අක්ෂාංශ නම් වේ. ( )

(13) ඉන්දු පාකිස්ථාන් දේශ සීමාවේ රාජස්ථාන් ප්‍රාන්තයේ ථාර් කාන්තාරය පිහිටා තිබේ. ( )

(14) ගංගා නම් ගඟ හිමාලය කඳු වැටියෙන් ආරම්භ වී බෙංගාල බොක්කට ගලා බසී. ( )

(15) 1 : 50 00 හු ලක්ෂණ සිතියමක භූමිය මතුපිට කිලෝමීටරයක දුරක් සිතියමෙහි සෙන්ටිමීටර හතරකින් දැක්වේ. ( )

- **අංක 16 - 20 දක්වා ඇති A සහ B තීරු දෙක නිවැරදිව ගළපා යා කරන්න.**

| A තීරුව | B තීරුව |
|---|---|
| (16) සූර්යයාට දුරින්ම පිහිටා ඇති නිසා අධික ශීතලකින් යුක්ත ය. | පාකිස්ථානය |
| (17) තාරකා විද්‍යා සංගමය මගින් වාමන ග්‍රහයෙක් ලෙස නම් කරන ලදි. | ප්ලූටෝ |
| (18) හින්දු කුෂ් කඳුවැටිය පිහිටි රට | නෙප්චූන් |
| (19) සුන්දර බාන්ස් වගුරු බිම පිහිටි රට | භූතානය |
| (20) වෙරළ තීරයක් අහිමි රට. | බංග්ලාදේශය |

(ලකුණු 2 x 20 = 40)


## II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) දී ඇති භූ ලක්ෂණ සිතියම අධ්‍යයනය කරන්න. එහි A - B , C - D , E - F, G - H වලින් දක්වා ඇති භූ ලක්ෂණ හඳුනාගන්න. ඊට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරාගෙන පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (නිම්නය, නෙරුව, කඳුවැටිය, කොත් කන්ද, කපොල්ල)




(ලකුණු 04)

(ii) 1 : 50 000 භූ ලක්ෂණ සිතියම මත දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත සඳහන් සම්මත සලකුණු නියමිත වර්ණ හා සංකේත මගින් ඇඳ දක්වන්න.

- පාසල
- තැපැල් කාර්යාලය
- වැව
- පළාත් මායිම
- ප්‍රධාන මාර්ගය (A) ශ්‍රේණිය

(ලකුණු 02 x 5 =10)

(02) (i) සෞරග්‍රහ මණ්ඩලයට අයත් අභ්‍යවකාශ වස්තූන් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අභ්‍යන්තර ග්‍රහලෝක කාණ්ඩයට අයත්වන ග්‍රහලෝක හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) "අප ජීවත්වන ග්‍රහලෝකය පෘථිවියයි." එහි ඇති සුවිශේෂී ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) විශ්වය පිළිබඳ වැදගත් තොරතුරු ලොවට හෙළිකළ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 02)

(ii) අභ්‍යවකාශ තොරතුරු ගවේෂණය සඳහා යොමුවූ රටවල් දෙකක් හා එම ගවේෂණ සඳහා යොදාගන්නා උපකරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සෞරග්‍රහ මණ්ඩලය හා බැඳී පවතින විශ්වාස පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(04) (i) ලෝකයේ ප්‍රාදේශීය වශයෙන් සම්මත වේලාවන් කිහිපයක් භාවිත කරන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවියේ භ්‍රමණය යනු කුමක්දැයි හඳුන්වා, භ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පෘථිවියේ ප්‍රධාන ඍතු හතර නම් කර, ඉන් ඔබ කැමැති එක් ඍතුවක් තෝරාගෙන එහි ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) "පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර තුනකි." ඉන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ජල ගෝලයෙන් අපට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ජලය දූෂණය වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කර, ඒවා වළක්වා ගැනීමට අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම අනුව උතුරු මායිම හා දකුණු මායිම කුමක්දැයි පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) දකුණු ආසියානු කලාපයට අයත් රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) හිමාලය කඳුකරයේ ජීවත්වන ගෝත්‍රික ජනතාවගේ ජීවන රටාව පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(07) (i) දකුණු ආසියාවේ වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) වෙරළබඩ භූ දර්ශනය විනාශ කරන අහිතකර මානුෂ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාව වටා මුහුදු වෙරළේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට බලපාන සංචාරක ආකර්ෂණ පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)